ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා වැඩසටහන- 4 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2018

**ESD2230/EPD4530** ළමා සංවර්ධනය II

කාලය - පැය තුන (03) යි.

---

දිනය - 2019 මාර්තු 09 වන දින        වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලු ප්‍රශ්නවලටත් 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකටත් (03) පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ප්‍රජානනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

02. (i) ස්නායුවල මූලික ක්‍රියාකාරකම් තුනක් (03) නම් කරන්න.

    (ii) නම් කරන ලද එක් ක්‍රියාවක් කෙටියෙන් පැහැදිලි කරන්න.

03. පිටියුටරි ග්‍රන්ථියේ කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න.

04. උදාහරණ දක්වමින් සංජානනය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

05. උදාහරණයක් දක්වමින් දඩුවම යන්න පැහැදිලි කරන්න.

06. පුද්ගල පෞරුෂය කෙරෙහි බලපෑ හැකි සාධක හතරක් (04) දක්වන්න.

07. රූපභූමි මූලධර්මය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න.

08. ඔබ උගත් න්‍යායකට අනුව ඉගෙනුම සිදුවන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. (i) ගුරුවරයෙකු වශයෙන් "පෞරුෂ වර්ග" හා "පෞරුෂ ගති ලක්ෂණ" පිළිබඳ ඔබ තුළ ඇති අවබෝධය සිසුන්ගේ ඉගෙනුමට උදව් කිරීම සඳහා යොදාගන්නා ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ළමයින් තුළ දක්නට ලැබෙන මනෝවිද්‍යාත්මක අක්‍රමතා පහක් **(05)** නම් කරන්න. (ලකුණු 05)

(iii) ඔබ ඉහත නම් කරන ලද එක් අක්‍රමතාවක ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 05)

10. (i) "අවධානය" ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(ii) ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය තුල ශිෂ්‍යයින්ගේ අවධානය කෙරෙහි බලපාන බාහිර සාධක පහක් **(05)** ලියන්න. (ලකුණු 05)

(iii) ඉහත නම් කරන ලද බාහිර සාධක සිසුන්ගේ අවධානය කෙරෙහි බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

11. (i) "ධනාත්මක උපස්ථම්භන" සහ "සෘණාත්මක උපස්ථම්භන" උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) "නිරීක්ෂණාත්මක ඉගෙනුම" සංකල්ප සාධනය පහසු කරන ආකාරය උදාහරණ සමගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. (i) "වෙන්වීමේ කාංසාව"(Separation Anxiety Disorder) පිළිබඳ අක්‍රමතාව සුදුසු උදාහරණයක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) පෙරපාසල් ළමයින් තුළ වෙන්වීමේ කාංසාව අඩුකිරීම සඳහා ගුරුවරයෙකුට ගත හැකි උපාය මාර්ග දෙකක් (02) පැහැදිලි කරන්න. (ලකුණු 5 x 2 = 10)

13. (i) සිසුන් තුළ මනෝවිද්‍යාත්මක අක්‍රමතා වර්ධනය වීමට සමාජ වාතාවරණය බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

(ii) ළමයින් තුළ මනෝවිද්‍යාත්මක අක්‍රමතා අවම කිරීම සඳහා ගුරුවරයාට මැදිහත් විය හැකි ආකාරය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.